# 11 වන ශ්‍රේණියේ ඉතිහාසය විෂයය ඉගැන්වීමේ දී ගුරුවරුන් භාවිත කරන ඉගැන්වීම් ක්‍රම පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්.

OUSL Library.
Donated by.
Dr. W. M. S. Wanasinghe,
Head/Dept. of Secondary
& Tertiary Education

ඩබ්.ඒ.එම්.පී. පත්මසිරි කුමාර වනසිංහ

ශාස්ත්‍රවේදී (ගෞරව), ශාස්ත්‍රපති (සිංහල),

පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ අධ්‍යාපනපති උපාධියේ අවශ්‍යතා පූර්ණය සඳහා ඉදිරිපත් කෙරෙන පර්යේෂණාත්මක නිබන්ධනයකි.

VERIFIED
2017

OPEN UNIVERSITY
73942

ද්විතියික හා තෘතියික අධ්‍යාපන අධ්‍යයනාංශය

අධ්‍යාපන පීඨය

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

නාවල

නුගේගොඩ.

2015



73942

## සංක්ෂිප්තය

ශ්‍රී ලංකාවේ පාසල්වල 11 වන ශ්‍රේණියේ ඉතිහාසය විෂයය ඉගැන්වීමෙහි නිරත ගුරුවරුන් භාවිත කරන ඉගැන්වීම් ක්‍රම පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් යන මෙම පර්යේෂණය සඳහා සමීක්ෂණ පර්යේෂණ පිරිසැලසුම තෝරා ගන්නා ලදි. මෙම පර්යේෂණය අරමුණු 5ක් ඔස්සේ දිශා ගත කරන ලදි. එනම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී භාවිත කරන විවිධ ඉගැන්වීම් ක්‍රම පිළිබඳ ගුරුවරුන්ගේ දැනුවත් භාවය විමසා බැලීම, 11 වන ශ්‍රේණියේ ඉතිහාසය විෂයය උගන්වන ගුරුවරුන් භාවිත කරන ඉගැන්වීම් ක්‍රම අනාවරණය කර ගැනීම, ගුරුවරුන් යොදා ගන්නා ඉගැන්වීම් ක්‍රම පිළිබඳ සිසු සංජානනය විමසා බැලීම, ඉතිහාසය විෂයය ඉගැන්වීම සඳහා විවිධ ඉගැන්වීම් ක්‍රම යොදා ගැනීමේ දී ගුරුවරුන් මුහුණ දෙන ගැටලු විමසා බැලීම, ගුරුවරුන් යොදා ගන්නා ඉගැන්වීම් ක්‍රම සංවර්ධනය සඳහා යෝජනා ඉදිරිපත් කිරීම යන අරමුණුයි.

දත්ත රැස් කිරීමට සිසු, ගුරු, විදුහල්පති, ගුරු උපදේශක සහ විෂයය අධ්‍යක්ෂ යන කාණ්ඩ නියැදිය සඳහා තෝරා ගත් අතර සිසු නියැදිය කැකිරාව අධ්‍යාපන කලාපයේ 1AB පාසලක්, 1C පාසල් දෙකක්, සහ 2 වර්ගයේ පාසල් දෙකක් මගින් සිසුන් 100ක් සරල අහඹු නියැදි ක්‍රමයෙන් තෝරා ගන්නා ලදි. එසේම මෙම පාසල්හි විදුහල්පතිවරුන් අදාළ නියැදිය සඳහාත් කලාපයේ සේවය කරන ඉතිහාසය විෂයය ඉගැන්වීමෙහි නිරත ගුරුවරුන් ගුරු නියැදිය සඳහාත් කලාපයේ ගුරු උපදේශක සහ විෂයය අධ්‍යක්ෂ ද තෝරා ගන්නා ලදි.

ප්‍රශ්නාවලී මගින් ගුරු සිසු දෙපාර්ශ්වයෙන් ප්‍රමාණාත්මක දත්ත ලබා ගත් අතර විදුහල්පති, ගුරු උපදේශක සහ විෂය අධ්‍යක්ෂ යන නියැදියෙන් සම්මුඛ සාකච්ඡා පවත්වමින් ගුණාත්මක දත්ත ලබා ගන්නා ලදි.

රැස් කර ගත් දත්ත වගු ප්‍රස්තාර ප්‍රතිශත ඇසුරින් ප්‍රමාණාත්මකව මෙන්ම ගුණාත්මකව ද විශ්ලේෂණය කරන ලදි. ඒ අනුව පහත සඳහන් නිගමනයන්ට එළඹිණි. ඉතිහාසය විෂයයට කැමැති නිසා ඉගැන්වීමෙහි නිරතවන බව, ඉතිහාසය විෂයය තුළින් ඓතිහාසික තොරතුරු දැන ගත හැකි බව, අනිවාර්ය විෂයන්ගෙන් වඩාත් කැමති විෂයය ගණිතය බව, ඉතිහාසය ඉගැන්වීම සඳහා වැඩි වශයෙන් සාකච්ඡා ක්‍රමය භාවිත කරන බව, විවිධ ඉගැන්වීම් ක්‍රම පිළිබඳ ගුරුවරුන්ගේ දැනුවත් භාවය අවම මට්ටමක පවතින බව, ඉතිහාසය විෂයය ඉගැන්වීමෙහි නිරත ගුරුවරුන්ගෙන් වැඩි පිරිසකට විශේෂ පුහුණුවක් නොමැති බව, කලාප

කාර්යාල මඟින් ලබා දෙන සේවාස්ථ වැඩසටහන්වලට ගුරුවරුන්ගේ සහභාගිත්වය සතුටුදායක මට්ටමක පවතින බව, විවිධ ඉගැන්වීම් ක්‍රම පිළිබඳව පුහුණුවක් ලබා ගැනීමට ගුරුවරුන් දැඩි කැමැත්තක් දක්වන බව, සාධන මට්ටම ඉහළ යාමට විවිධ ඉගැන්වීම් ක්‍රම භාවිතය හේතු වන බව, ඉතිහාසය විෂයයට වෙන්ව තිබෙන කාලච්ඡේද ප්‍රමාණවත් නොවීම සහ විෂයය නිර්දේශය පුළුල් වීම ගුරුවරුන් මුහුණදෙන ගැටලු බව, විවිධ ඉගැන්වීම් ක්‍රම භාවිත කිරීමේ දී පාසල ආශ්‍රිතව ගැටලුවලට ගුරුවරුන් මුහුණදෙන බව, ඉතිහාසය ඉගෙන ගැනීමේ දී සිසුන් ප්‍රායෝගික ඉගැන්වීම් ක්‍රමවලට වඩාත් කැමති බව, ඉතිහාසය විෂයය සාර්ථකව ඉගැන්වීමට ඉගැන්වීම් ක්‍රම භාවිත කිරීම සහ ඉගෙනුම් ආධාරක භාවිත කළ යුතු බව යන්නයි.

ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගැන්වීම් ක්‍රම භාවිත කිරීම, විෂයය දැනුම සංවර්ධනය කර ගැනීම, ඉගැන්වීම් ක්‍රම පිළිබඳ පුහුණුව යාවත්කාලීන කිරීම, කලාප මට්ටමින් විෂයය ප්‍රවර්ධන කටයුතු සංවිධානය කිරීම, විෂයය ඉගැන්වීමට කාලච්ඡේද සංඛ්‍යාව වැඩි කිරීම සහ විෂයයට අදාළ අතිරේක කියවීම් පොත් මුද්‍රණය කර බෙදා හැරීම යෝජනා ලෙස ඉදිරිපත් කර ඇත.

## Abstract

This survey has been designed for research on comprehensive study on teaching methods used by the teachers to teach history in schools in Sri Lanka. Furthermore this has been directed towards five goals. There are To the awareness of the teachers about proper teaching methods in teaching process, To reveal the teaching methods used by teachers who teach history in grade 11, How student acquire these teaching methods used by teachers in teachinh history subject, Studying challenges of using various teaching methods for teaching history and Suggestions to develop these teaching methods.

As the samples the students, teachers, principals, in service advisers and subject directors selected for the data collection. Student sample consists of a 1AB school, two 1C schools and two type 2 schools. In random sample selected 100 students. Selected the principals of above mentioned schools, the teachers who handle the subject, in service adviser and the subject director of Kekirawa educational zone.

Obtained quantitative data directly from both the students' teachers by questionaries and qualitative data from the principals, in service adviser and the subject director by interviewing.

Collected data was analysed in tables, graphs and percentages. Accordingly following conclusions can be highlighted. It was revealed that this subject is selected as they like the subject; they can have the understanding on historical matters. As well we understood that the most favourite among the compulsury subjects was mathematics, the most favoured method of teaching history was discussion method, and the awareness of teachers on different types of teaching methods was a lack. Surprisingly we found that most of the teachers who teach history were not with a proper training. The participation in the sessions organized by the zonal educational office was in a satisfactory rate. It revealed that teachers are eager to acquire new methods of teaching even. Then we understood that adopting various teaching methods we could improve the results at national level exams.

Clearly it revealed that the periods allocated for history were inssufficiant. The other barrier for the teachers was the the scope of the subject. They face lot of problems at schools when using teaching methods. When learning history students like using practical methods most. As well it revealed that for a successful teaching process we need to have different teaching methods and teaching aids.

Implementation of child centered education, improving new subjective knowledge, updating the knowledge on teaching methods, organizing promotion campaign to promote the subject in zonal level, increasing the number of periods allocated for history and publishing additional readers on history were among leading suggestions.